**ශීර්ෂය - 335 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 335 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්න වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| (අ) | 3.2 (අ) | අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුමත කර ගැනීමට සැලැසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. | 3.2 (අ) |
| (ආ) | 3.2(ආ), (ඇ),(ඈ),(ඉ) | සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුවේ. | 3.2(ආ) |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50(1) ප්‍රකාරව, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරියාගේ වගකීම වුවත්, 2022 අප්‍රේල් 26 දින නිකුත් කර තිබුණු අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ගමන් සීමා කර තිබියදීත් විදේශීය ගමන් වියදම් වැය විෂයය සඳහා රු.50,000 ක ප්‍රතිපාදන සලසා ගෙන, එම මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයකට මාරු කරගෙන තිබුණි. | 03/2022 භාණ්ඩාගාර උපදෙස් අනුව, විදේශ ගමන් සීමා කළ යුතු බැවින්, විදේශ ගමන් වියදම් වැය විෂයේ රු.50,000 ක මුළු ප්‍රතිපාදනයම වැය විෂය අංක 1302 සඳහා මාරු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 50(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සකස් කළයුතු වුවත්, එසේ නිශ්චිත සැලැස්මක් යටතේ ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමේ එකතුව රු.17,185,000 ක් වූ වැය විෂයන් 04 කට අදාලව රු.583,800 ක සිට රු.2,242,749 ක් දක්වා ප්‍රතිපාදන එනම් සියයට 27 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් ප්‍රතිශතයක් පැවතුණි. | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අහෝසි කර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන සේවා කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමට 2022 වර්ෂයේ යෝජනා වූ බැවින් මේ සඳහා වියදම් දැරීම අත්හිටුවන ලද බව හා ආයතනයේ භාවිතා කරනු ලබන වෙබ් අඩවියම අවශ්‍යතා අනුව වැඩිදියුණු කර පවත්වාගෙන යාමට තීරණය වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුකර ගැනීම එනම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා සිදු කරනු ලබන පරීක්ෂණ හා සංවර්ධනය වියදම් වෙනුවෙන් කොමිෂන් සභාවේ මුළු ප්‍රතිපාදන වලින් සියයට 11 ක් පමණක් එනම් රු.8,300,000 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු.2,242,749 ක ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. | අවසන් කරන ලද අධ්‍යයන පර්යේෂණ වාර්තා 2023 දෙසැම්බර් 31 වන විට මුද්‍රණ කටයුතු සඳහා යොමු කර තිබුණි. එම ආයතනවල මුද්‍රණ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් ඒ සඳහා වූ ගෙවීම් ඉදිරි වසරට ගෙනයාම සිදු වූ බව. | ආයතනය පිහිටුවීමේ අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. | ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන බවට ලිඛිතව විගණකාධිපති වෙත සහතික වී ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ලේකම්ගේ 2009 ජුනි 17 දිනැති අංක 09/2009 හා 09/2009 (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ඇතැම් ඉහළ කළමණාකාරිත්වයේ නිලධාරීන් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සලකුණු කර නොතිබුණි. | මේ සඳහා කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 21 වන සියවසට සරිලන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට අදාල වැඩපිළිවෙල සඳහා වසර 30 ක් පමණ පැරණි කොමිෂන් සභා පනත සංශෝධනය කර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණද පනතේ නිර්දේශිත සංශෝධන 2022 ඔක්තෝබර් 05 වන දින අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළද, රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව දැනුම් දී නොතිබීම මත වර්ෂය අවසාන වනවිටත් එම කාර්යය අවසන් කර නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙතෙක් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව අප ආයතනයට දැනුම් දී නොමැති බව. | සැලසුම්ගත කාර්යයන් නිම කිරීමට ක්‍රියා කල යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ මිලදීගන්නා ලද මූලා තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ තුල ඇතුලත් රු.309,990 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක් 2021 වර්ෂයේදී අලුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත යොමුකර තිබුණ අතර, මේ දක්වා නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් එම වටිනාකම සහිත වත්කමෙහි පැවැත්ම විගණනයේදී තහවුරු නොවීය. | වායුසමීකරණ යන්ත්‍රය ආයතනයට ගෙන්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මූලා ප්‍රකාශන තුල ඇතුලත් මූලා නොවන වත්කම් වල පැවැත්ම තහවුරු කර ගත යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව 2022 වර්ෂයේදී කැසට් රෙකෝඩර් 03 ක් හා 2023 වර්ෂයේදී ඩිජිටල් වොයිස් රෙකෝඩර් 02 ක් ඌන ලෙස හදුනාගෙන තිබුණු නමුත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර දෙපාර්තමේන්තු ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 හා 2023 භාණ්ඩ සමීක්ෂනයේ දී අනාවරණය වු ඌන භාණ්ඩ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව කොමිෂන් සභාවට අදාළ කර ගත හැකි ලෙස හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සභාව විසින් සභාවේ විෂයපථය වනුයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම වන අතර, එම ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ආයතන විසින් එම ඉලක්ක හා අරමුණු සැකසිය යුතුව ඇති බව විගණනයට දන්වා තිබුණි. | මෙම ආයතනයේ විෂය පථයට ගැනෙන කාර්යභාරය වනුයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම වන අතර, එම ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ආයතන විසින් ඒ සම්බන්ධව තිරසර සංවර්ධන ඉලක්ක සහ අරමුණු සැකසිය යුතුව ඇති බව. | සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි එකඟතාවයකට පැමිණිය යුතු වීම. |

## 5. යහපාලනය

### විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවතිය යුතු වුවත්, වර්ෂය තුළ රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණි. | 2023 වසර තළ විගණන හා කළමණාකරණ කමිටු දෙකක් (02) 2023 මාර්තු 17 දින සහ 2023 දෙසැම්බර් 20 දින වල පවත්වා ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් ගණකාධිකාරී තනතුර 2020 අගෝස්තු 26 දින පුරප්පාඩු වී තිබුණු නමුත් එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කිරීමකින් තොරව 2023 නොවැම්බර් දක්වා වසරකට වැඩි කලක සිට වැඩබැලීම සඳහා නිලධාරීන් පත්කර තිබුණි. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අහෝසි කර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමේ යෝජනා හේතුවෙන් තාවකාලිකව අත්හිටුවන ලද බව. | පුරප්පාඩු පිරවීම අවශ්‍ය නොවේනම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |